## අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ව්‍යාපාරය

**පූජ්‍ය අඹලියද්දේ නන්ද හිමි**
සංස්කෘත අධ්‍යනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
*ambaliyaddenanda@gmail.com*

කලින් කලට ලොව විශිෂ්ටයින් බිහිවීම සිදුවන්නකි. ඒ අතරින් සිය ජීවිතයම ලෝකයා වෙනුවෙන් කැප කරන පුද්ගලයින් බිහිවන්නේ අතලොස්සක් තරම් සුලු පිරිසකි. ඒ අතරට වැටෙන නාමාවලියක අත්‍යුදාර ශ්‍රීමත් අනගාරික ධර්මපාල යන නාමය විරාජිත නාමයකි. හෙළ දිව බිහි වූ අග්‍රගණ්‍ය ජාතිකාලය ඇති ආගමික භක්තියෙන් පිරිපුන් සිය ජීවිත අනුභූති සමුදායෙන් සිහ නද පෑ අනගාරික ධර්මපාලතුමා වීරවරයෙකි. 1864 සැප් 17 වන දින උපත ලද මෙතුමා ක්‍රමයෙන් අධ්‍යාපනය ලබා 1505 දී ලොරෙන්සු අල්මේදාගෙන් පටන් ගෙන මුල් බැස තිබු මිෂනාරි පාසල් තුළ වූ අද්දැකීම් ද වින්ද අයෙකි. කාලය ගෙවීමෙන් ක්‍රමාභිවෘද්ධියට පත් ඩේවිඩ් යන නාමයෙන් හැඳින්වූ මෙතුමා මුහුකුරා ගිය බුද්ධියකින් සැබෑව දකින්නට තරම් පරිණත අයෙකු විය. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිපාණන් වහන්සේ විසින් පවත්වන්නට යෙදුණු දේශන මගින් ජාතිකත්වය පිළිබඳ ස්වදේශාභිමානයෙන් අභිමානයට පත් මෙතුමා ස්වකිය ඉංග්‍රිසි නාමයට සමු දී ධර්මපාල යන නාමය තබා ගන්නේ එඩිතර බව වීරත්වය ජාතිමාමක බව ක්‍රියාවෙන් පවා පසක් කරමින්ය. ක්‍රමයෙන් සම්බුදු සසුනට අභියෝග පැවති කාලයක උපත ලද මෙතුමා තම ජීවිතය අනගාරික කොට ගත කරමින් කැප කළේ ජීවිතය තුළින් ම සම්බුදු සසුන, රට, ජාතිය, සුරකිම් යන්න සපථ කරමින්ය. ලෝකයේ කිසිම නායකයෙක් මේ තරම් තම ජාතියට බැණ වැදි නැත. ''වල් අලියා, ගොන් තඩියා'' යන වදන් සේම ''දෙමලු මොකද කරන්නෙ දවල්ට කාලා පත්තරය කියවනවා අනෙක් අය වට වෙලා අහගෙන ඉන්නවා. අපේ සිංහල ගොන් තඩියෝ මොකද කරන්නේ කාලා බුදි'' ආදී වශයෙන් මෙතුමා බැණ වැදුණේ ජාතිය පිළිබඳ තිබු වේදනාවෙන්ය. පුරාකෘත පුණ්‍ය මහිමයෙන් බිහි වූ මෙතුමා අපේ රටත්, ජාතියත්, ආගමත්, සංස්කෘතියත් හදන්නට වූ වෙහෙස අපමණය. සිංහල බෞද්ධයා, ලක්මිණි පහන ආදී පත්තර බිහිවීම දේශාන්තර සම්මේලන, මහාබෝධි සමාගම නිදා සිටි ජාතිය පිබිදවීමට ගත් වෑයමේ එක් පැතිකඩකි. සුදු ජාතිකයින්ගේ අහංකාරකම, කරුණා විරහිත බව, අසහනසීලි බව තදබල ලෙස විවේචනය කළ එතුමා ඕල්කට්තුමා සමඟ කළ සංචාරයෙන් දුප්පත් බව නිසා පාචන, උණ, මැලේරියාදි රෝග 84 කින් මිනිසුන් මිය යන බවද පෙන්වා දුන්නේය. එතුමා කථිකයෙකි. ජාත්‍යන්තර කීර්තිමත් සිංහලයෙකි, සංස්කෘතික විප්ලවයක් ඇති කළ නිර්භීත ප්‍රෞඩ ජනතා වාදියෙකි. බටහිර ක්‍රෛස්තව අධිරාජ්‍යවාදී පාලනයට නතුවීමේ ප්‍රතිඵලයක් ලෙසට විජාතික අනුකාරක මනසකින්

යුතුව භෞතික හා ආධ්‍යාත්මික අනාථ භාවයට පත්ව සිටි සිංහල බෞද්ධයා දේශවාත්සල්‍යයෙන්, ජාතිකානුරාගයෙන් උද්දාම කරවීම සඳහාත් සිය දේශය තුළ නැති වී ගිය අයිතීන් යළි දිනා ගැනීම උදෙසාත් නැඹුරු වූ බෞද්ධ බලවේග ඉදිරියට ගෙන යාමට උර දුන් පතාක යෝධයන් අතුරින් ධර්මපාලතුමා පෙරමුණ ගත්තෙක් වීය. එතුමා 1931 ජූලි 31 පැවිදිව, 1933 ජනවාරි 16 උපසපම්පදා වී 1933 අප්‍රේල් 29 දී දීර්ඝ වූ ආයාසකාරී ප්‍රයාමය නිමා කරමින් අපවත් වූහ. එසේ වුවත් ජාතිකානුරාගයෙන් පිරි අනගාරික ධර්මපාල නාමය සදානුස්මරණීය වේ.

මුඛ්‍ය පද : ජාත්‍යාලය, පොදු සමාජය, සම්බුදු සසුන, සංස්කෘතිය,සිංහල බෞද්ධයා